**මධ්‍යම සංස්කෘතික අරමුදල - 2016**

---

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මධ්‍යම සංස්කෘතික අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

--------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආයෝජනය කළ රු.මිලියන 1,600 ක් සහ ආයෝජන ආපසු ගැනීම් රු.මිලියන 100 ක් පිළිවෙලින් මුදල් ගලායාමක් සහ මුදල් ගලාඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වෙන් වෙන්ව දක්වා නොතිබුණි. තවද වර්ෂය තුළදී ප්‍රාග්ධනිත කරන ලද ආයෝජන පොලී රු.මිලියන 124 ක් මුදල් ගලායාමක් ලෙස දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

--------------------------------------------------

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.මිලියන 191.4 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද අපහරණය සඳහා පවතින වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අඩමාණ ණය වෙන්කිරීම සම්බන්ධයෙන් අරමුදල විසින් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයනොවන රු.1,587,362 ක ණයගැති ශේෂ පැවතියදී ඒ පිළිබඳ සමාලෝචනය කිරීමකින් තොරව සෑම වර්ෂයකදීම රු.1,964,833 ක් අඩමාණ ණය ලෙස වෙන් කරමින් තිබුණි.

(ආ) අරමුදල විසින් පුරාවිද්‍යාත්මක ස්ථාන නරඹන්නන් සඳහා නිකුත් කිරීමට මුද්‍රණය කර තිබූ ප්‍රවේශපත්‍ර වලින් සමාලෝචිත වර්ෂය අවසානයට මුද්‍රණ වියදම රු.3,424,990 ක් වූ ප්‍රවේශපත්‍ර තොග මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොකිරීම නිසා ප්‍රවේශපත්‍ර අවසන් තොග ශේෂය සහ වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) තොග සමීක්ෂණ වාර්තා අනුව ව්‍යාපෘති 08කට අදාළව පැවති රු.13,179,037 ක් වටිනා අනුරූ, ගොඩනැගිලි ද්‍රව්‍ය, ලිපිද්‍රව්‍ය හා ප්‍රකාශන 2016 දෙසැම්බර් 31 දිනට අවසන් තොගයේ ඇතුළත්

නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන තොගය හා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඈ) වර්ෂය තුළදී විවිධ පාර්ශවයන් වෙත පරිත්‍යාග කරන ලද රු.1,415,122ක් වටිනා අනුරූ සහ ප්‍රකාශන, තොග ගිණුමට බැර කිරීම වෙනුවට විකුණුම් ගිණුමට බැර කිරීම නිසා වර්ෂයේ විකුණුම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද වර්ෂ අවසාන අනුරූ තොගය වටිනාකම රු.1,286,258 කින් හා ප්‍රකාශන තොගය රු.128,864 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණ වාර්තාව අනුව ජේතවන ව්‍යාපෘතියට අදාළව රු.1,944,837 ක් වටිනා අතිරික්ත තොගයක් වාර්තා කර තිබුණු අතර ඊට හේතූන් සොයා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) අරමුදලේ ජංගම ගිණුමකට අදාළව 2016 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි 2016 ජූනි සිට පැවත එන රු.10,000 ක හඳුනා නොගත් බැර ශේෂයක් දක්වා තිබුණු අතර එම ශේෂය 2017 ඔක්තෝබර් වන විටද හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගැළපීම් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

ව්‍යාපෘති 2කට අදාළව ස්ථිර කම්කරුවන් වෙත ලබාදුන් යතුරුපැදි ණය ශේෂය සඳහා ප්‍රධාන කාර්යාලය විසින් පිළියෙල කළ සැසඳුම් ප්‍රකාශනය අනුව සහ ව්‍යාපෘති මඟින් එවන ලද වාර්තා අනුව 2016 දෙසැම්බර් 31 දිනට රු.270,808 ක සැසඳුම් නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවකයින් 05 දෙනෙකුගෙන් ආපදා ණය රු.287,083 ක්ද, සේවකයන් 03 දෙනෙකුගෙන් නිවාස ණය රු.766,048 ක්ද, සේවකයින් 55 දෙනෙකුගෙන් උත්සව අත්තිකාරම් රු.267,525 ක්ද, සේවකයින් 11 දෙනෙකුගෙන් විශේෂ අත්තිකාරම් රු.28,991 ක් වශයෙන් වර්ෂ 1ත් වර්ෂ 5 ත් අතර කාල පරාසයක් තුළ අයවීම් හිඟහිටි ණය ශේෂ ඇපකරුවන්ගෙන්, දේපල වලින් හෝ නීතිමය ක්‍රියාමාර්ග වලින් අයකර ගැනීමට මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද වර්ෂ 05කට වැඩි උත්සව අත්තිකාරම් රු.1,049,260 ක්ද, විශේෂ අත්තිකාරම් රු.76,499 ක්ද අයකරගෙන නොතිබුණු අතර එම ණය ශේෂද වර්ෂයක් තුළ අයකරගත යුතුව තිබුණද එසේ නොතිබීමට හේතු පැහැදිලි කර නොතිබුණි.

(ආ) විවිධ ණයගැති ශේෂය තුළ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් වසර 4 කට අධික කාලයක සිට අයවිය යුතු රු. 672,577 ක ශේෂයක් පැවතුණි.

(ඇ) ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇති විශේෂ අරමුදල් හා විදේශ අරමුදල් ව්‍යාපෘතිවලට අදාළ පිළිවෙලින් රු.8,806,885 ක සහ රු.4,376,549 ක ශේෂ 2012 වර්ෂයට පෙර සිට පැවති නමුත් එම ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත | |
| (i) | 4 (ඇ) වගන්තිය | මූලා‍ය ප්‍රකාශනවල වෙනත් සංස්කෘතික ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබූ රු.79,074,872 ක් පන්සල්, පෙරහැර, විහාර හා ආගමික උත්සව සඳහා ලබාදී තිබුණ ද මෙම පරිත්‍යාග සම්බන්ධයෙන් යථෝක්ත වගන්තිය අනුව පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද යථෝක්ත වගන්තියට පටහැනිව පාලක මණ්ඩල අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී විවිධ පාර්ශවයන් වෙත පිළිවෙලින් රු.1,286,258 ක් හා රු.128,864 ක් වටිනා අනුරූ හා ප්‍රකාශන පරිත්‍යාග කර තිබුණි. |
| (ii) | 4 (ඊ) වගන්තිය | යථෝක්ත වගන්තිය ප්‍රකාර අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ රු.මිලියන 1,600 ක් සම්බන්ධයෙන් පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 1940 අංක 9 දරන පුරාවස්තු ආඥා පනතේ 21(1) වගන්තිය | යථෝක්ත ආඥා පනතේ 21(1) වගන්තිය ප්‍රකාරව පුරාවිද්‍යා කොමසාරිස්වරයාගෙන් ලබාගත් අවසරයකින් තොරව හෝ 20 වන වගන්තිය යටතේ ඇතිකරගත් ගිවිසුමකින් තොරව හෝ පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක කිසිදු අළුත්වැඩියාවක්, ප්‍රතිසංස්කරණයක්, වෙනස් කිරීමක් හෝ අතිරේක ඉදිකිරීමක් සිදුකළ නොහැකි වුවද, 2008 ජුනි 06 දිනැති අංක 1553 දරන ගැසට් පත්‍රයෙන් ආරක්ෂිත ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති සිත්තම් ගල්ලෙන රජමහා විහාරයට අයත් භූමියෙහි ධර්මශාලාවේ සහ ඉපැරණි දේවාලයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අරමුදල විසින් රු.16,258,246 ක් වැයකර තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල් රෙගුලාසි 102,103,104 හා 105 | ❖ 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව මොණරාගල ව්‍යාපෘතියට අයත් උදළු, කුළුගෙඩි වැනි ආයුධ සහ ආම්පන්න වර්ග 9 කට අදාළ අයිතම් 19 ක් ද බටලීය අනුරූ පාසලට අයත් වර්ග අඩි 3132 ක පිත්තල තහඩු තොගයක ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිවයුත්තන් හඳුනාගැනීම 2017 නොවැම්බර් 30 දින දක්වා සිදුකර නොතිබුණි.<br><br>❖ දඹුල්ල ප්‍රකාශන ගබඩාවේ රු.499,368 ක් වටිනා ප්‍රකාශන තොග ඌනතාවයක් ඇතිවී වසර 5 කට අධික කාලයක් ගතවී ඇතත් ඒ සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිවයුත්තන් හඳුනාගැනීම හා අදාළ පුද්ගලයන්ගෙන් |

| | | |
|---|---|---|
| | | අලාභ අයකරගැනීම හා විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම ආදී කටයුතු සිදුකර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 381(1) | දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාල සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව බැංකු ජංගම ගිණුම් 25 ක් ආරම්භ කර තිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් වෙන වෙනම හඳුනාගත හැකිවන පරිදි ඒ ඒ වත්කම් භාණ්ඩය යටතේ ඇති වත්කම් සංකේත කිරීම සිදුකර නොතිබුණි. මේ නිසා අරමුදලට අයත් ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල වල පැවති වටිනාකම රු.1,155,763,937 ක් වූ වත්කම්වල භෞතික පැවැත්ම සත්‍යාපනය කිරීමට නොහැකි තත්ත්වයක් පැවතුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල වල පැවති රු.56,002,545 ක් වටිනා පරිගණක හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඊ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අභයගිරිය ව්‍යාපෘතියේ නවතා තිබුණු ප්‍රයෝජනයට ගත නොහැකි ට්‍රැක්ටර් 04 ක්, යතුරුපැදි 02 ක්, ත්‍රිරෝද රථයක් සහ ජල බවුසරයක් සම්බන්ධයෙන් යථෝක්ත චක්‍රලේඛය ප්‍රකාරව අපහරණ කටයුතු සිදුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,696,834,303 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 867,115,250 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලය රු. 829,719,053 කින් එනම් සියයට 95.6 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රවේශපත්‍ර අලෙවි ආදායම රු.694,863,531 කින්, ප්‍රකාශන අලෙවි ආදායම රු.6,915,018 කින්, ආයෝජන ආදායම රු.138,856,955 කින්, වෙනත් ආදායම් රු.10,103,771 කින් හා විලම්භිත ආදායම රු.27,097,930 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.227,294,733 ක්වූ අතිරික්තය අඛණ්ඩව වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමෙන් පසු 2012 වර්ෂයේ රු. 891,233,340 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂයේදී රු. 3,034,217,986 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත අනුව සංස්කෘතික ත්‍රිකෝණය තුළ ඇති සංස්කෘතික ස්මාරක සහ වෙනත් ප්‍රදේශයක සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීම, ජේතවන දාගැබ යෝජනා ක්‍රමයෙහි හා වෙනත් යෝජනා ක්‍රමයන්හි සියලු වියදම් පියවීම, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ආගමික කටයුතු ප්‍රවර්ධනය, ආගම නංවාලීම හෝ ආගමික ස්ථාන පවත්වාගෙන යාම, සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රයට සේවය කර ඇති තැනැත්තන්ට ප්‍රදානයන් පිරිනැමීම, කලා කටයුතු සඳහා ආධාර ලබාදීම හා මහජනයාට ප්‍රතිලාභයක් සැලසෙන වෙනත් ආගමික හෝ සංස්කෘතික කාර්යයන් සඳහා අරමුදල් යෙදවීම යනාදිය ප්‍රධාන අරමුණු විය. මෙම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංචාරක මණ්ඩල වෙබ් අඩවියෙන් ලබාගත් තොරතුරු වලට අනුව 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව හා අරමුදලේ පොත්පත් අනුව, අරමුදල විසින් අලෙවි කළ සංචාරක ප්‍රවේශපත්‍ර සංඛ්‍යාව අතර විශ්ලේෂණයක් පහත දැක්වේ.

| වර්ෂය | ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව | අරමුදල විසින් අලෙවිකළ සංචාරක ප්‍රවේශපත්‍ර ප්‍රමාණය | අලෙවිකළ ප්‍රවේශපත්‍ර ප්‍රමාණය සංචාරකයින්ට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස | ප්‍රවේශපත්‍ර ආදායම |
|---|---|---|---|---|
| | | | | රු. |
| 2013 | 1,274,593 | 504,699* | 39* | 1,748,439,894 |
| 2014 | 1,527,153 | 627,136* | 41 | 2,200,143,813 |
| 2015 | 1,798,380 | 722,676* | 40 | 2,751,061,677 |
| 2016 | 2,050,832 | 903,755* | 45 | 3,445,925,208 |

(*එක් සංචාරකයකු විසින් එක් පුරාවිද්‍යාත්මක ස්ථානයක් පමණක් නරඹන්නේ යයි උපකල්පනය කර ගණනය කිරීම් සිදුකරන ලදී.)

ඉහත තොරතුරු අනුව 2013, 2014 හා 2015 හා 2016 වර්ෂ තුළ ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාවට සාපේක්ෂව අරමුදල විසින් අලෙවිකළ ප්‍රවේශපත්‍ර ප්‍රමාණය පිළිවෙලින් සියයට 39, සියයට 41, සියයට 40 ක් හා සියයට 45 ක් විය. ඒ අනුව පෞරාණික සංස්කෘතික නටඹුන් සහිත ස්ථාන නැරඹීම හා ආගමික කටයුතු ප්‍රවර්ධනය සඳහා සංචාරකයින් ආකර්ෂණය කරගැනීමට අලෙවි ප්‍රවර්ධන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම තුළින් තවදුරටත් ආදායම් වර්ධනය කර ගැනීමේ හැකියාවක් පවතින බව නිරීක්ෂණය කෙරේ.

(ආ) අරමුදල විසින් පිළියෙල කර තිබූ වැඩ සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකිරීමට සැළසුම්කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.92,657,086 ක් වූ කැණීම් හා සංරක්ෂණ ව්‍යාපෘති වලට අදාළ වැඩබිම් සහ ක්‍රියාකාරකම් 22 ක් වර්ෂය තුළ ආරම්භ කර නොතිබුණි.

(ඇ) වැඩ සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකිරීමට සැළසුම් නොකළ ව්‍යාපෘති 03 කට අදාළ වැඩබිම් සහ ක්‍රියාකාරකම් 04 ක් සඳහා රු.3,976,597 ක් වැය කර තිබුණි.

(ඈ) 2016 වර්ෂයේ ප්‍රගති වාර්තාවන්ට අනුව වර්ෂය තුළ වැඩ අවසන් වූ වැඩබිම් හා ක්‍රියාකාරකම් 51කින් 21 ක් සඳහා වැඩ සැලැස්ම අනුව අධි ඇස්තමේන්තු මත මුදල් වෙන් කිරීම සිදුකර තිබුණි. ඒ තුළ වූ වැඩබිම් සහ ක්‍රියාකාරකම් 13 කට අධි ඇස්තමේන්තු මත වැඩ ඒකක සැළසුම් කර තිබුණි.

**4.2** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොළඹ ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ නීත්‍යානුකූල අයිතිය අරමුදලට පවරා ගැනීමට 2017 ඔක්තෝබර් 31 දින දක්වාම අපොහොසත්ව තිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශ අධීක්ෂණය යටතේ පැවති අපේගම ආයතනයේ අධීක්ෂණ කටයුතු මධ්‍යම සංස්කෘතික අරමුදලට පැවරීම සඳහා දෙපාර්ශවය විසින් අත්සන් තබන ලද 2016 ජූනි 16 දිනැති අංක ED/10/NH/03/02/01/07 දරන අවබෝධතා ගිවිසුමේ 08 ඡේදයට අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි අපේගම ආයතනයේ සියලු ගොඩනැගිලි සහ භාණ්ඩ විධිමත් පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් භාර ගැනීමට කටයුතු කළයුතු වුවද අරමුදල විසින් 2017 ඔක්තෝබර් 31 දින දක්වා එසේ සිදුකර නොතිබුණි.

(ඇ) 2014 නොවැම්බර් 12 දින රැස්වූ පොදු ව්‍යාපාර කමිටුව විසින් ගනු ලැබූ අංක 09 දරන තීරණය පරිදි පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙසත් ඊට අදාළව භාණ්ඩාගාර අනුමැතිය ලබාගන්නා ලෙසත් දක්වා තිබුණි. එහෙත් අධ්‍යක්ෂ (මුදල්),අධ්‍යක්ෂ (පාලන), ප්‍රවේශපත්‍ර අලෙවිකරු, සහකාර අධ්‍යක්ෂ (මුදල්), ප්‍රධාන පරීක්ෂණ නිලධාරී, නීති නිලධාරී තනතුරු සඳහා බඳවාගැනීමකින් තොරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවාගෙන සේවයේ යොදවා තිබුණි.

(ඈ) මිහින්තලා රජමහා විහාරස්ථානයේ ආවාසගෙය සහ ධර්මශාලාව ඉදිකිරීම සඳහා 2016 මැයි 11 දිනැති අංක 2863 දරන ගෙවීම් වවුචරය මඟින් රු.මිලියන 15 ක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණද ගෙවීම් මුදල් පොතෙහි ගෙවීම්ලාභියා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් ලෙස දක්වා තිබුණි.

(ඉ) අරමුදල විසින් අලෙවි කළ ප්‍රවේශපත්‍ර සඳහා 2015 දෙසැම්බර් 09 දින ගනුදෙනුකරුවකුගෙන් ලැබී තිබූ රු.231,000 ක චෙක්පතක් අගරු වී තිබූ අතර එය 2017 ඔක්තෝබර් 30 දින වනවිටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2014 අගෝස්තු 13 දින රු.5,000,000 ක මුදලක් හාතිගමුව ගුරුගොඩ විහාරයේ ධර්මශාලාව ඉදිකිරීම සඳහා ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලබා දී තිබුණි. මෙම ධර්ම ශාලාව ඉදිකිරීම 2017 ඔක්තෝබර් 31 දින වනවිට ද නිමකර නොතිබුණි.

(උ) 2012 වර්ෂයේ දී රු.මිලියන 4.2 කට තක්සේරු කළ අරමුදලේ දේපළක් වූ මහනුවර පිහිටි ප්‍රිම්රෝස් ඉඩම 2013 වර්ෂයේ සිට මහරගම ශාසන සේවක සංගමයේ නුවර සංගමය ලෙස ගොඩනැගිලි ඉදිකර භික්ෂු පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යනු ලබන නමුත් එම දේපළ අරමුදල වෙත පවරා ගැනීමට අපොහොසත්ව තිබුණි.

(ඌ) 2016 දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණ වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ දී අභයගිරිය ව්‍යාපෘතිය මඟින් සඳහිරු සෑය, පොතුවිල් මුහුදු මහා විහාරය, ශ්‍රී සම්බෝධි යෝගාශ්‍රමය, මහමෙව්නා භාවනා අසපුව වෙත 2011 – 2014 කාලය තුළ තාවකාලිකව ලබා දී තිබූ GI යකඩ බට 3105ක්, කප්ලින් ( Cufflinks ) 4150 ක් හා භාණ්ඩ ප්‍රවාහන විදුලි සෝපාන 01 ක් නැවත ලබාගැනීම සඳහා අරමුදල විසින් අපොහොසත්ව තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.19,944,705 ක් වූ සමුච්චිත අරමුදල තුළ ඇතුළත් වූ, 1983 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.66,390 ක හඳුනා නොගත් ශේෂය පැන නැගීමට හේතු සොයා එය නිරවුල් කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට හර කර තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුරූ නිෂ්පාදන, ප්‍රකාශන හා මුද්‍රණ යන අංශ වල නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ දී චක්‍ර පිරිවැය සැලකිල්ලට නොගැනීම හේතුවෙන් අනුරූ නිෂ්පාදනයන්හි නිෂ්පාදන පිරිවැය නිවැරදිව හඳුනා ගැනීමෙන් තොරව විකුණුම් මිල තීරණය කිරීමට කටයුතු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරතිබූ වැඩ සැලැස්මෙහි ව්‍යාපෘති 10ක් තුළ ඇතුළත් ක්‍රියාකාරකම් 21 ක ඇස්තමේන්තුගත පිරිවැය සහ ප්‍රගති වාර්තාවන් අනුව තථ්‍ය පිරිවැය අතර සියයට 20 සිට සියයට 186 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**--------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 පෙබරවාරි 02 දිනැති අංක 11/0169/555/004 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව අරමුදල විසින් උපයා ගනු ලබන ප්‍රවේශපත්‍ර ආදායමින් සියයට 25 ක් පුරාවිද්‍යා ස්ථාන පවත්වාගෙන යාම වෙනුවෙන් පුරාවිද්‍යා කළමනාකරණ භාරය වෙත ලබාදිය යුතු වේ. ඒ අනුව 2016 වර්ෂයේ අරමුදලේ ආදායම වූ රු. 3,445,925,208 කින් සියයට 25 ක් ලෙස රු. 861,481,302 ක් එම භාරය වෙත ලබාදිය යුතු වුවද ලබාදී තිබුණේ රු.104,490,691 ක් පමණි.

(ආ) අරමුදලේ අනුමත තනතුරක් වන සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියකු බඳවාගෙන, කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරමින් 2016 අගෝස්තු 01 දින සිට 2017 ජූලි 30 දින දක්වා මාසයකට රු.72,916 ක් බැගින් රු.874,992 ක දීමනා ගෙවා තිබුණි. අරමුදලේ සියලුම නෛතික කටයුතුවලට අදාළ රාජකාරී මෙහෙයවීම සහ අධිකරණ කටයුතුවලදී අරමුදල වෙනුවෙන් නීතිඥයෙකු ලෙස අධිකරණය ඉදිරියේ පෙනී සිටීම මෙම තනතුරට පැවරෙන කාර්යයන් වී තිබුණි. එහෙත් අවස්ථා 03 කදී බාහිර නීතිඥයන් දෙදෙනෙකුගෙන් ලබාගත් සේවාවන් වෙනුවෙන් අරමුදල විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.1,457,425 ක් ගෙවා තිබුණි.

(ඇ) 2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 3.3 වගන්තිය අනුව නිල වාහනයක් හිමි නිලධාරියෙකු හට එම නිල වාහනය පාවිච්චි කිරීම හෝ මාසිකව රු.30,000ක් හා තනතුරට හිමි මාසික ඉන්ධන දීමනාව ලබා ගත හැකි වේ. 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 1/2015 (i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව 2016 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම දීමනාව රු.50,000 දක්වා වැඩිකර තිබුණ ද අරමුදල විසින් වැඩ බලන අධ්‍යක්ෂ (මුදල්) වෙත 2016 ජනවාරි 01 සිට අගෝස්තු 31 දක්වා රු.50,000 ප්‍රවාහන දීමනාව ලබා දී තිබුණි. ඒ අනුව අරමුදල විසින් මාස 08 ක් සඳහා රු.160,000 ක ප්‍රවාහන දීමනාවක් වැඩ බලන අධ්‍යක්ෂ (මුදල්) වෙත වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) 2016 ජූලි 06 සිට 08 දක්වා මහනුවර ප්‍රදේශයේ පෞද්ගලික හෝටලයක පැවැත්වූ සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේ වැඩමුළුවක් සඳහා අරමුදලේ විධායක හා විධායක නොවන වශයෙන් ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරීන් හා සේවකයන් 86 දෙනෙක් සහභාගීවී ඒ වෙනුවෙන් රු.1,430,200 ක වියදමක් දරා තිබුණි. අදාළ නිලධාරීන්ට සහභාගිත්ව දීමනා ලෙස රු.53,500 ක් ගෙවා තිබුණද ඊට අදාළ නීතිමය විධිවිධාන පැහැදිලිකර නොතිබුණි. මෙවැනි වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීමේදී 2015 සැප්තැම්බර් 25 දිනැති අංක SP/SB/07/15 දරන ජනාධිපති චක්‍රලේඛයේ අඩංගු විධිවිධාන කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

**4.5** **ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගැටබරුව විහාරයේ විශ්‍රාම ශාලාව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2015 මැයි 21 දින ප්‍රදානය කර තිබුණ ද අධ්‍යක්ෂ ජනරාල් හා කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් අත්සන් කර තිබුණේ 2015 ජුලි 07 දිනදීය. ගිවිසුම් ගත දින සිට දින 568කින් වැඩ අවසන් කිරීමට නියමිත වුවද 2017 ජුනි 13 දින වනවිට නිමකළ වැඩ ප්‍රමාණය සියයට 73 ක් විය. ලබාදුන් අත්තිකාරම් මුදල තුළ සියයට 11 ක එකතු කළ අගය මත බදු ලෙස රු.861,871 ක් ඇතුළත් වුවද අත්තිකාරම් නැවත අය කිරීමේ දී එකී මුදල අයකර නොගැනීම නිසා උක්ත කොන්ත්‍රාත්තුව මගින් අරමුදලට රු.861,871 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) උපදේශකයන් තෝරා ගැනීමේ හා සේවයේ යෙදවීමේ ශ්‍රී ලංකා මාර්ගෝපදේශයෙහි 3.1 හා 3.2 වගන්ති අනුව උපදේශක ආයතන හෝ කේවල උපදේශකයන් තෝරා ගැනීමේදී උපදේශකයින්ගේ තාක්ෂණික හා මූල්‍ය යෝජනා සැසඳීම පදනම්කරගෙන තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළයුතු වේ. නමුත් එම වගන්ති වලට පටහැනිව අරමුදල විසින් පුරාවිද්‍යා උපදේශක, වාස්තු විද්‍යා උපදේශක සහ භූ විද්‍යාත්මක උපදේශක සේවා සපයා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.2,973,692 ක් වැයකර තිබුණි.

**4.6** **වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අරමුදලේ සම්පත්**

-------------------------------------------------------------------

අරමුදලට අයත් හන්තාන පිහිටි වටිනාකම රු.මිලියන 4 ක්වූ ගොඩනැගිලි 02ක්, 2012 වර්ෂයේ සිට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ප්‍රයෝජනයට ගනු ලබන මුත් එම ගොඩනැගිලි අරමුදල වෙත පවරා ගැනීමට අපොහොසත්ව තිබුණි.

**4.7** **කාර්ය මණ්ඩල පරිපාලනය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 4 ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මගින් ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් අභ්‍යන්තර හෝ බාහිර අයදුම්කරුවන්ගෙන් බඳවාගැනීම් සිදුකළ යුතුවේ. නමුත් එකී ක්‍රියාමාර්ග අනුගමනය කිරීමකින් තොරව ජේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් වසර 02 ක කාලසීමාවකට අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා 2015 මාර්තු 19 දින කොන්ත්‍රාත් පදනම මත නිළධාරියෙකු පත්කර තිබුණි.

(ආ) අරමුදලේ අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා 2012 වර්ෂයේ සිට ස්ථිර පත්කිරීමක් සිදුකර නොතිබුණු අතර එම තනතුර සඳහා 2016 අගෝස්තු මාසයේදී කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු පත්කර 2016 අගෝස්තු 15 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා රු.341,210 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. එයට අදාළව පහත නිරීක්ෂණ සිදු කෙරේ.

(i) අරමුදලේ බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 4.2.3.1 අනු ඡේදය අනුව අධ්‍යක්ෂ(මුදල්) තනතුර සඳහා බාහිර පදනම මත බඳවා ගැනීමේදී අධ්‍යාපන සුදුසුකම් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණය / මූල්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක් සමග අදාළ විෂය පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ හෝ සහතිකලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබිය යුතු බව දැක්වුනි. නමුත් එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරියා ගණකාධිකරණ

ඩිප්ලෝමාව සහ වරලත් ගණකාධිකරණ ආයතනයේ අවසන් I විභාගය පමණක් සමත්වූ අයෙකු විය.

(ii) අරමුදලේ බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 4.4 අනු ඡේදය අනුව අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා පොදු සුදුසුකම් යටතේ වයස අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි වියයුතු බව දක්වා තිබුණද කොන්ත්‍රාත් පදනමට බඳවාගත් නිලධාරියා අවුරුදු 70 ඉක්මවූ අයෙකු විය.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ ලේකම් අමතන ලද 2011 ජූලි 21 දිනැති අංක DMS/E/1/54/9/241 දරන ලිපියෙහි 03 ඡේදය ප්‍රකාරව ඉදිරි බඳවාගැනීම් සිදු කිරීමට පෙර බඳවාගැනීම් පටිපාටිය සංශෝධනය කළයුතු බව දක්වා තිබුණ ද 2017 ඔක්තෝබර් 31 දින දක්වාම එම පරිපාටිය සංශෝධනය කර නොතිබුණි.

(ඈ) අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුළත් නොවූ කෞතුකාගාර අධ්‍යක්ෂ තනතුර සඳහා රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ නිළධාරියෙකු 2015 මැයි 05 දින කොන්ත්‍රාත් පදනම මත වර්ෂයක කාලයකට පත්කර වාර්ෂිකව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. එම නිලධාරියා වෙත මාසයකට රු.38,500 ක් බැගින් 2016 වර්ෂය තුළ රු.462,000 ක් ගෙවා තිබුණි.

(ඉ) අරමුදලේ බඳවාගැනීම් හා උසස් කිරීමේ පරිපාටියේ 4.6.2 අනු ඡේදය අනුව පරිපාලන නිළධාරී තනතුරට අභ්‍යන්තර පදනම මත බඳවාගැනීමේදී සේවා පලපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම්, විශේෂ ක්‍රියාකාරකම් හා කාර්යසාධනය පදනම් කරගනිමින් ලකුණු ලබාදීම කළයුතු වේ. එහි අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම් යන නිර්ණායකය යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතු බව දක්වා තිබුණද අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් හා අඩු සේවා පළපුරුද්ද සහිත පුද්ගලයෙකු හට ඉහළ ලකුණු ලබාදී පරිපාලන නිලධාරී තනතුර සඳහා 2016 ජනවාරි 01 දින උසස් කොට තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 04 ඡේදයට අනුව දිගුකාලීන දැක්මක් සහිතව අදාළ පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතුය.එසේ වුවද අරමුදල විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර කැණීම් හා සංරක්ෂණ ව්‍යාපෘති සඳහා පමණක් වැඩ සැලැස්මක් පිළියෙල කර තිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා වර්ෂය ආරම්භ වීමට පෙර පාලක මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවද අනුමැතිය ලබාගෙන තිබුණේ 2016 නොවැම්බර් 25 දිනදීය.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ පිරිවැය රු.16,328,430 ක් වූ වාහන සහ පිරිවැය රු.2,970,200 ක් වූ පරිගණක සහ උපාංග සමාලෝචිත වර්ෂය තුළ දී මිලදී ගෙන තිබුණි.

(ඇ) උපදේශකයන් තෝරා ගැනීමේ හා සේවයේ යෙදවීමේ ශ්‍රී ලංකා මාර්ගෝපදේශයෙහි 5.2.1 (අ) වගන්තිය අනුව සංරක්ෂණ උපදේශක සේවා සපයා ගැනීම වෙනුවෙන් ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් තොරතුරු අරමුදලේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල වෙනුවෙන් පිළියෙල කළ ප්‍රසම්පාදන සැලැස්මෙහි, ප්‍රාදේශීය කාර්යාල සඳහා ප්‍රසම්පාදනය කරනු ලබන භාණ්ඩ, වැඩ හා සේවා ඇතුළත් කර නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.2.5 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට ප්‍රථම එම මූල්‍ය වර්ෂයෙහි අයවැය ලේඛනය, පාලක මණ්ඩලය විසින් අනුමත කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද 2016 වර්ෂය සඳහා අයවැය ලේඛනය පාලක මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ 2016 නොවැම්බර් 25 දින දීය.

(ii) එම අයවැයෙහි අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් වල සියයට 21 සිට සියයට 203 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2013, 2014 හා 2015 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2017 ඔක්තෝබර් 30 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5.5 නොවිසඳී ඇති විගණන ඡේද**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන ඡේදයට යොමුව හා වර්ෂය | නිරීක්ෂණය |
|---|---|
| (අ) 2012 – 4.5 අ,ආ,ඇ | පොළොන්නරුව පූජා භූමියේ අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය කිලෝ මීටර් 1 ක් සංවර්ධනය කිරීමේ කාර්යය වෙනුවෙන් නිසි ප්‍රමිතියෙන් තොර කොන්ක්‍රීට් කුට්ටි ගල් භාවිතා කර රු. 22,099,917 ක් ගෙවා තිබීම, ප්‍රමාණපත්‍රය අනුව ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු. 4,660,998 ක් ගෙවා තිබීම හා ABC ස්ථරය සියයට 40 ක් හා ගල්කුඩු මිශ්‍රණය සියයට 50 ක් අඩුවෙන් යොදා තිබීම හේතුවෙන් මාර්ගය සමතුලිතතාවයෙන් තොරවීම යන අඩුපාඩු සම්බන්ධව 2017 නොවැම්බර් 30 දින දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2013 – 4.4 (අ) (ii) | පොළොන්නරුව පූජා භූමියේ පිටවීමේ දොරටුවේ සිට අභ්‍යන්තරයට ඇති මාර්ගය කිලෝ මීටර් 01 ක් දුරට කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉටුකිරීමේදී නිසි ප්‍රමිතියට නොමැති කොන්ක්‍රීට් කුට්ටි ගල් යොදා ගෙන තිබුණ ද ඒ පිළිබඳව තත්ත්ව පරීක්ෂාවන් සිදුකිරීමට පෙර කොටස් මුදල් ලෙස රු.16,992,545 ක් ගෙවා තිබුණි. |
| (ඇ) 2015 4.8 (අ) | බටලීය අනුරු පාසලේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පෞද්ගලික සමාගමක් වෙත 2014 සැප්තැම්බර් 11 දින රු.මිලියන 46.4 කට ප්‍රදානය කර තිබුණි. 2015 මැයි 11 දින කොන්ත්‍රාත්තුව අවසන් කළයුතුව තිබුණද 2017 ඔක්තෝබර් 31 දින වනවිටද ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි. |
| (ඈ) 2015 4.4 (අ) (iii) | සේවක රක්ෂණ ආවරණය ලබාගැනීම වෙනුවෙන් පුද්ගලික රක්ෂණ සමාගමක් වෙත සාවද්‍ය නාමලේඛනයක් ඉදිරිපත් කර සේවකයින් 50 දෙනෙකුගේ නම් වැඩිපුර ඇතුළත් කර ඒ සඳහා රු. 475,000 ක් ගෙවා තිබුණු අතර අදාළ ව්‍යාජ ලේඛන සකස්කළ නිලධාරින්ගෙන් එම මුදල් අයකර ගැනීමට 2017 ඔක්තෝබර් 31 වන විටද කටයුතු කර නොතිබුණි. |

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතා සම්බන්ධයෙන් වරින්වර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | | අනුරු, ප්‍රකාශන හා මුද්‍රණ යන අංශ වලට අදාළව නිෂ්පාදන ගිණුම් පිළියෙල කර නිවැරදිව නිෂ්පාදන පිරිවැය හඳුනාගෙන නොතිබීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | (i) | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම හා දීර්ඝ කාලයක සිට ඇතැම් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් සේවයේ යෙදවීම. |
| | | (ii) | බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය නොකිරීම. |

(ඇ) ප්‍රසම්පාදනය

(i) පිළියෙල කරතිබූ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ප්‍රමාදවීම.

(ii) ප්‍රසම්පාදන සැලැස්ම, අයවැය හා සමගාමීව පිළියෙල කර නොතිබීම.

(ඈ) අයවැය පාලනය

(i) අයවැය ලේඛනය සඳහා පාලක මණ්ඩල අනුමැතීන් ලබාගැනීමට ප්‍රමාද වීම හා සැළකිය යුතු විචලනයන් පැවතීම.

(ඉ) ණයගැති පාලනය

(i) දිගුකලක සිට පවතින ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු නොකිරීම.

(ii) අඩමාණ ණය වෙන්කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නොමැති වීම.

(ඊ) තොග පාලනය

(i) තොග සමීක්ෂණ වාර්තා හා මූල්‍ය ප්‍රකාශන අතර වෙනස්කම් පැවතීම.

(ii) ප්‍රවේශපත්‍ර තොග සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලිව දක්වා නොතිබීම.